# ලංසු සඳහා ආරාධනයයි (IFB)

# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) භූමි අලංකරණ සහ වාහන නැවැත්වීමේ පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු

### කොන්ත්‍රාත් (ලංසු) අංකය : TRC/ADM/01/24/03/34

කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක 276 හි පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් පහත විස්තර කර ඇති පරිදි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ භූමි අලංකරණ සහ වාහන නැවැත්වීමේ පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා යෝග්‍ය සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

**01. කාර්ය විෂය පථය**

භූමි අලංකරණ හා වාහන නැවැත්වීමේ පහසුකම් සංවර්ධන ඉදිකිරීම් ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL)

- මෝටර් රථ නැවැත්වීමේ ස්ථාන සහ යතුරුපැදි නැවැත්වීමේ ස්ථාන ඉදිකිරීම.
- නව දිගුකළ ගොඩනැගිල්ල සඳහා වාහන නැවැත්වීමේ ආවරණ පහසුකමක් (Car Porch) ඉදිකිරීම.
- පැරණි පරිපාලන ගොඩනැගිල්ල හා නව දිගු කළ ගොඩනැගිල්ල එකිනෙක සම්බන්ධ කරන සම්බන්ධක මාර්ගයක් (කොරිඩෝවක්) ඉදිකිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ඉදිරිපස පරිශ්‍රයේ වැසි ජල අපවහන පහසුකම් සංවර්ධනය කිරීම ඇතුළුව වාස්තු ශිල්පීය හා භූමි අලංකරණ කටයුතු සිදු කිරීම.

කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක 276 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පරිශ්‍රයේ පිහිටා ඇත.

**ඉදිකිරීම් කාලය දින 60 කි.**

02. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය ප්‍රකාරව ලංසු කැඳවීම සිදු කරනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලබන සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**ශ්‍රේණිය** : ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් – C6 හෝ ඊට ඉහළ ශ්‍රේණියක ලියාපදිංචියක් තිබිය යුතුය.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් වන්නේ,

- ❒ පසුගිය වසර පහක කාලයතුළ සිදුකළ ඉදිකිරීම් කටයුතුවල සාමාන්‍ය වාර්ෂික වටිනාකම අවම වශයෙන් රුපියල් මිලියන 30 ක් විය යුතුය.
- ❒ මෙම ව්‍යාපෘතිය සඳහා පමණක් අවශ්‍ය වන අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම් ප්‍රමාණය රුපියල් මිලියන 05 ක් විය යුතුය.
- ❒ පසුගිය වසර 05 ක කාලය තුළ, එක් කොන්ත්‍රාත්තුවක් යටතේ (අවම වශයෙන් 50% ක් සම්පූර්ණ කර ඇති) රුපියල් මිලියන 20 ක් හෝ ඊට වැඩි වටිනාකමකින් යුත් ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති පළපුරුද්ද තිබිය යුතුය.

05. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ – 08 වෙතින් ලබා ගත හැකි අතර, වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉහත ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන අංශ කාර්යාලයේදී ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

06. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් 2026.06.01 සිට 2026.06.17 දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ, අධ්‍යක්ෂ (පාලන හා ආයතනික කටයුතු), ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ – 08 වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර, ආපසු නොගෙවන රු. 7,500.00 ක ගාස්තුවක් ගෙවීමෙන් ලබාගත හැක.

07. ලංසු 2026.06.18 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි, සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ලිපිනයට භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම එම අවස්ථාවට සහභාගිවීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

08. සියලුම ලංසු සමග රු. 500,000.00 ක ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර, එය 2026.06.18 සිට 2026.09.14 දක්වා (ලංසු වලංගු කාලයට අමතර දින 28 ක් දක්වා) වලංගු වේ.

09. පූර්ව ලංසු රැස්වීම 2026.06.10 දින පෙ.ව. 10.00 ට කොළඹ 08 ඇල්විටිගල මාවත, අංක 276, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වේ.

ඉහත ලංසු යොමු කළයුතු ලිපිනය වන්නේ,

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,**
**අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ - 08.**
**2026.05.29**